# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,924 — 1964 ජනවාරි 17 වැනි සිකුරාද — 1964.1.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 101 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 108 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 109 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | 119 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 118 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 119 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

## විශෙෂ නිවේදනයයි

1964 ජනවාරි 28 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1964 ජනවාරි 31 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1964 ජනවාරි 25 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 ජනවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂාකාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ **මෙනත් කරුණු අතර** කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත් වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂාකාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළහැකි වන්නේ ය.

**සංලක්‍ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙන් ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයකින් සමත්වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. **අවශ්‍ය සුසුදුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූද, රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නොවන්නේ ය).

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අත්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලක රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්‍ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු, ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

---

අංක : ඒ. 384/එක්ස්. 1460/63.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### මහරගම රජයේ ගුරු විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මහරගම රජයේ ගුරු විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ තනතුරු දෙකක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළ යුතු අයදුම් පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර, මා වෙත ලැබෙන සේ එවිය යුතුයි:—

(ඒ) මෙරට අයදුම් පත්—1964 ජනවාරි මස 31 වැනිදා.

(බී) පිටරට අයදුම් පත්—1964 පෙබරවාරි මස 7 වැනිදා.

**සංලක්‍ෂ්‍යය :**—(i) අයදුම් පතක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නො හැක. අවසාන දිනය දක්වා අයදුම් පත් ප්‍රමාදකිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුයි.

(ii) විදේශීය අයදුම්කරුවන්ට අවශ්‍ය වන මුද්‍රිත අයදුම් පත් පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම තමාගේ අයදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා තමා පදිංචි රටට හෝ තමාට ආසන්නම රටට හෝ පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුලතදී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය හා ගමන් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයින් ඉදිරියෙහි වෛද්‍ය පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ ගමන් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතුවේ.

2. **වැටුප් දීමනා.**—මෙම තනතුරු සඳහා රු. 5,160—360 වැටුප් වැඩිවීම් 9—රු. 8,400 ක වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුරු, පාසැල් ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ගුරුවරුන් ලෙස විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ ශික්ෂකයන් මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබේ නම්, ඔවුන් විසින් දරණ නාක් මෙම තනතුරු විශ්‍රාම වැටුප් හිමි තනතුරු ලෙස ප්‍රකාශ කරනු ලැබේ.

4. **අධ්‍යාපනික හා අනිකුත් අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔවුන් පිළිබඳ පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :

(ඒ) 1964 ජනවාරි මස 31 වැනි දිනට වයස අවුරුදු 28ට නොඅඩු බවට හා අවුරුදු 50ට නොවැඩි බවට (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ අයගේ අයදුම් පත් උපරිම වයස සීමාව ගැන නොසලකා සලකා බලනු ඇත.)

(බී) උසස් ක්‍රීඩකයෙකු ලෙස ගණන් ගැනීමට සුදුසු අන්දමේ විශිෂ්ඨ වාර්තාවක් තිබිය යුතු ; හා

(සී) පිළිගත් විද්‍යාලයක හෝ ආයතනයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳව උපාධියක් හෝ ඩිප්ලෝමාව. මේ සඳහා අඩුම වශයෙන් පහත සඳහන් කරුණු සම්පූර්ණව තිබිය යුතු ය. එනම් :—

(i) එක් අවුරුදු නේවාසික පශ්චාත් උපාධි පාඨමාලාවක් හෝ,

(ii) එවැනි ආයතනයක අඩු ගණනේ අවුරුදු දෙකක නේවාසික පාඨමාලාවක් අනුගමනය කර තිබීම සහ ශාරීරික අධ්‍යාපන ගුරුවරයෙකු වශයෙන් හෝ ශාරීරික අධ්‍යාපන පාඨශාලා පරීක්‍ෂකයෙකු වශයෙන් අවුරුදු දෙකක පළපුරුද්දක් ලබා තිබීම.

(ඩී) ක්‍රීඩා හා මල්ලව ක්‍රීඩා පිළිබඳව විශිෂ්ඨ වාර්තා ලබා ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු වීම සහ යටත් පිරිසෙයින් වර්ෂ පහක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා ලබා තිබීම. (ක්‍රීඩා හා මල්ලව ක්‍රීඩා සංවිධානය කිරීම හා පැවැත්වීම පිළිබඳ පුරුද්ද සමග) හෝ

(ඊ) ගුරු විද්‍යාලවල ශාරීරික අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ කථිකාචාර්යවරයෙකු වශයෙන් අඩු ගණනේ අවුරුදු 8ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ද්විතීයික පුහුණු පළමුවන පෙළ ගුරුවර/ගුරුවරියක් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු වීම.

(එෆ්) (i) සිංහලෙන් වැඩ කිරීමට හොඳ හැකියාවක් තිබීම, තෝරා ගනු ලබන අයදුම්කරුවන් විද්‍යාලයයේ සියලුම ක්‍රීඩා පිළිබඳ කටයුතු භාරව සිටීම අවශ්‍ය වේ.

(ii) ඔවුන්ට සිංහල භාෂාවෙන් දේශන පැවැත්වීමට හැකියාවක් තිබීම.

(ජී) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බවට.

5. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදුව, නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගත් බව නිර්දේශ නොකළහොත් එම අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍යවනු ඇත :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බෞතිස්ම සහතික හෝ උපකෘත පාසැල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.)

(බී) උපාධි සහතික පත්‍ර හෝ උසස්ම අධ්‍යාපනික සහතික පත්‍ර.

(සී) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුයි.

(ඩී) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඊ) සිංහලෙන් සමත් වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

සංලක්ෂ්‍යය.—(i) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නොඇමිණිය යුතුයි.

(ii) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම් පත්‍ර සලකා බලනු නො ලැබේ.

7. තෝරාගනු ලැබූ අපේක්ෂකයන් පළමුවෙන්ම මහරගම රජයේ ගුරු විද්‍යාලයට අයත්ව සේවය කරන නමුත් මාරුකර යැවීමට ඉඩ ඇත.

8. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි ද බලනු මැනවි.

10. අයදුම් පත්‍ර සියල්ලම ලැබුණ බව දන්වනු ඇත. අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 7ක් ඇතුලත තම අයදුම් පත්‍රය ලැබුණ බව දන්වන ලිපියක් නො ලත් අයදුම්කරුවෙක් වේ නම් ඔහු විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත වහාම දැන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරීමෙන් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 1, ගාළුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයයේදීය.
නැ. පෙ. 500.

1–552/1—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

අංක: ඒ. 390/එක්ස්. 1461/63.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පර්යේෂණ නිලධාරි තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි තනතුරු දෙකක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලයෙන් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍ර මත සකස් කළ යුතු අයැදුම් පත්, මතු සඳහන් දිනවල හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය :—

(අ) මෙරට අයදුම් පත්.—1964 ජනවාරි මස 31 වැනිදා.

(ආ) පිටරට අයදුම් පත්.—1964 පෙබරවාරි මස 7 වැනිදා.

**සටහන්.**—(i) අයැදුම් පතක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් හෝ තැපැලේදී නැති වූ බවට නොහොත් ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය තෙක් තම අයැදුම් පත් ප්‍රමාද කර ගන්නා අයැදුම්කරුවන් එයින් සිදුවන පාඩුව විඳ දරා ගැනීමට සූදානම් ව එසේ කළ යුතුය.

(ii) පිටරට අයැදුම්කරුවන්ට මුද්‍රිත ආකෘති පත් විදේශීය රටවල සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත් ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කරනු ලැබ සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාර දීමට අයැදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශීය රටවලින් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතු වේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා තතු.**—(i) මෙය විශ්‍රාම වැටුප් හිමි සථිර තනතුරෙකි.

(ii) මී ළඟ ඡේදයේ කියැවෙන වර්ෂයකට රු. 8,400ක් වීමට පෙරාතුව ඇති කාර්යක්ෂමතා කඩ ඉමෙන් ඔබ්බට උසස් කරනු ලබන්නේ, නිලධාරියා යෙදී සිටින විද්‍යානුකූල වැඩ කටයුතු අතින් නියමිත පශ්චාත් උපාධියක් හෝ ඉහළ පෙළ ඩිප්ලෝමාවක් හෝ ලබා ගත හොත් පමණි.

3. **වැටුප් සහ දීමනා.**—තනතුරට අයත් වැටුප, වර්ෂයකට රු. 4,080 කින් පටන් ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 12 කින් ද රු. 480 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 10 කින් ද වැඩි වෙමින්, වර්ෂයකට රු. 11,280ක් වූ තැන දැවුරුද්දක විරාමයක් ඇතිව, වර්ෂයකට රු. 8,400ක් සහ රු. 11,760ක් වීමට පෙර පිළිවෙලින් කාර්යක්ෂමතා කඩ ඉම් දෙකක් ද ඇතුව, වර්ෂයකට රු. 13,200 දක්වා නගී.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම—

(අ) 1964.1.31 වනදාට තම වයස අවුරුදු 30 කට නො වැඩි බවටද,

(ආ) තමා විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශාරීරික සනීපයෙන් හෙබි බවට ද,

(ඉ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක, රසායන විද්‍යාව විෂයයෙහි 1 වන පෙළ නොහොත් 2 වන පෙළ ගෞරවය සහිත උපාධියක් ලබා ඇති උපාධිධරයෙකු බවටද, නැතහොත්

(ii) මහා බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ රාජකීය රසායන විද්‍යා සංසථාවේ සමාගම්කාරයෙකු බවටද,

පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

**සටහන.**—සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අපේක්ෂකයෙකු වන විට, පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික විභාගයේදී හෝ ඒ හා සම තත්ත්වයේ විභාගයකදී හෝ සිංහල භාෂා විෂයයෙන් නැතහොත් සමාන විෂයයකින් සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

(1961 ජනවාරි 1 වනදාට පෙර දිනක සිට රජයේ සේවයේ යෙදී සිටිමින් රජයේ සේවයේ වෙනත් තනතුරුවලට පත්වීම් අපේක්ෂා කරන නිලධාරීන් කෙරෙහි මෙම නියමය බල නොපායි).

5. මතු සඳහන් ලියකියවිලි සියල්ලම හෝ එයින් කිසිවක් හෝ ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට, අයැදුම්කරුවන් ඒවා ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතිකවත්, උපකෘත පාසැල්වල රීති මාලාව යටතේ කාර්යයන් සඳහා නිකුත් කෙරෙන උප්පැන්න සහතිකවත්, මේ සඳහා බාර ගනු නො ලැබේ) ;

(ආ) උපාධිය නොහොත් ලැබූ ඉහළ ම අධ්‍යාපන සහතිකය ;

(ඉ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාල ශික්ෂකගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය ;

(ඊ) ලබා ඇති වෘත්තීය සහ/නොහොත් කාර්මික සුදුසුකම් දක්වෙන සහතික ;

(උ) සිංහලෙන් සහ/නොහොත් දෙමළෙන් සමත් වූ ඉහළ ම විභාගය දැක්වෙන සහතික.

**සටහන.**—(i) ලියකියවිලි වත්, ලියකියවිලිවල පිටපත් වත් අයැදුම් පතට අමුණා නො එවිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ කල් හි ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයැදුම්කරුවන්ගේ අයදුම් පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. අයැදුම් පත් හෝ ඒ හා සම්බන්ධිත සෙසු ලියුම් කියුම් හෝ එවිය යුත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන අමතා මිස, මෙම දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකු නමට පුද්ගලිකව අමතා නොවේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදය ආරම්භයේ පළවී ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන, පොදු කොන්දේසි කියවා බලනු මැනවි.

8. අයැදුම්පත් ලැබුණ බව, අයැදුම්පත් එවූ සියළු දෙනාට ම දන්වනු ඇත. තම අයැදුම්පත ලැබුණ බව දැන්වෙන ලිපියක්, අයැදුම්පත් බාර ගැනීම අවසන් කළ දිනයේ සිට තෙ දිනක් ඇතුළත දී යම් කිසි අයැදුම්කරුවෙකුට නො ලැබුණොත්, ඒ බව එවිගසම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. මෙම නියමය ඉටු කිරීමට අපොහොසත් වීමෙන්, තම අයැදුම් පත ගැන සලකා බලන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය අයැදුම්කරුට නො ලැබී යනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 ජනවාරි මස 11 වැනිදා,
කොළඹ, තැ. පෙ. අංක 500 දරණ
ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායසිලයේ දීය.

1–552/2—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඇස්.එච්. 332/60.

## පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් යාන්ත්‍රිකයින් බඳවා ගැනීම

ලංකා පොලිස් සේවයේ කොස්තාපල් යාන්ත්‍රිකයින්ගේ තනතුරු සඳහා පහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් වලින් යුත් ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගත් ඉල්ලුම් පත් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්‍ෂ වරයා වෙත ලිපිනය කර, 1964 පෙබරවාරි මස 10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපලෙන් එවිය යුතුයි.

3. **වැටුප් ක්‍රමය.**—පළමුවෙනි අවුරුද්ද වර්ෂයකට රුපියල් 750 ; ඉන්පසුව වර්ෂයකට රුපියල් 840—22 × 42—රුපියල් 1,764.

රු. 1,060 ; රු. 1,260 ; රු. 1,470 හා රු. 1,638 යන වැටුප් තලයකට ලඟාවන්නට පෙර කාර්යක්ෂමතා කඩඉම් වෙයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—කොස්තාපල් යාන්ත්‍රිකයින්ගේ තනතුරු සඳහා ඉල්ලුම්කරුවන්ට පහත දක්වා ඇති සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) 1964 පෙබරවාරි මස 10 වැනි දිනට වයස අවුරුදු 18 ටත්, 30 ටත් අතර විය යුතුයි. සේවාමුක්ත භටයනට සාමාන්‍ය වයස පිළිබඳ අනුග්‍රහය ලැබෙනු ඇත. ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවකයිනට, අංක 427 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් පැවරෙන සියළු අනුග්‍රහ යන් හිමිවේ.

(ආ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවලින් එක් බසක් කියවීමට සහ ලිවීමට පුළුවන්කම තිබිය යුතුයි.

(ඇ) පිළිගත් මෝටර් ඉංජිනේරු සමාගමක හෝ වෙනත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ අවුරුදු 21 කට නොඅඩු කාල යක ආධුනිකත්වය සාර්ථක ලෙස සම්පූර්ණ කොට තිබිය යුතුයි.

(ඈ) පෙනීම එක් ඇසකින් 6/12 ට අඩු නොවිය යුතුය. එක් ඇසක පෙනුම 6/6 නම්, අනෙක් ඇසින් 6/18 පෙනුම පිළිගනු ලැබේ.

(ඉ) වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

(ඊ) අවිවාහක විය යුතුයි. සේවා මුක්ත භටයෝද ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවකයෝද මෙම අවශ්‍යතාවයෙන් මුදනු ලැබෙයි.

5. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වේ.

(අ) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලටද අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ඇ) තෝරා ගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායසී සංවිධානයෙන් වන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය සහ පොලිස්පති වරයා විසින් හෝ ආණ්ඩුව විසින් හෝ විටින් විට නිකුත් කරන වෙනත් නියෝගයන්ට යටත් විය යුතුවේ.

(ඈ) තෝරාගනු ලබන අපේක්ෂකයින්ගේ පත්වීම් ස්ථිර කරන තුරු විවාහවීමට අවසර දෙනු නොලැබේ. කෙසේ වෙතත්, මේ සඳහා අවුරුදු දෙකක සතුටුදායක සේවයක් ඇති ආධුනික කොස්තාපල් යාන්ත්‍රිකයින් ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලා, පොලිස්පති වරයාගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරු වලට අදාල පොදු කොන්දේසි වලට අවධානය යොමු කළ යුතුයි.

8. කොස්තාපල් යාන්ත්‍රිකයින්ට—

(අ) නොමිලයේ නිවාස ;

(ආ) නොමිලයේ නිල ඇඳුම් ; සහ

(ඇ) ඇඳුම් කට්ටල පෙට්ටි, පලස් සපත්තු සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය යනාදිය ද සපයනු ලැබේ.

9. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම්පත් වලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) මෑතදී ගන්නා ලද චරිත සහතික දෙකක් ; සහ

(ඇ) සිව් වසරක වැඩ ඉගෙන ගන්නකු ලෙස පුහුණුව ලැබීමේ සහතිකය.

10. අවසාන දිනට පසුව ලැබෙන සහ මෙම ගැසට් නිවේදනයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අපේක්ෂකයින්ට පිළිතුරු සපයනු නොලැබේ.

සෑ. ආ. දිසානායක,
පොලිස් පති.

1964 ජනවාරි මස 6 දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේදී ය.

### ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය සහ 1964 පෙබරවාරි මස 10 වැනි දිනට වයස :————.

(1) ජාතිය :————.
ලාංකිකයෙක් වූයේ ලියාපදිංචිවීමෙන්ද, පරම්පරාවෙන්ද? :
————.

(2) පරම්පරාවෙන් ලාංකිකයෙකු වී නම් මතු දැක්වෙන අය උපන් ස්ථාන සඳහන් කරන්න :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ මුත්තා :————.

(ඈ) අයදුම්කරුගේ මී මුත්තා :————.

අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙකු නම්, (අ) හැරුණ විට, (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ නූපන් අයෙකු නම්, (අ) හැරුණු විට, (ආ) සහ (ඇ) හෝ (ඈ) හෝ පිරවිය යුතුය.

4. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ඔබ සමත් වී ඇත්තේ කිනම් පන්තියෙන් ද ? :————.
(භාෂා මාධ්‍යය සඳහන් කරන්න)

(ආ) ඔබට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා කියවන්නට සහ ලියන්නට පුළුවන් ද ? :————.

5. වෘත්තීය සුදුසුකම් :————.

ආධුනික කාලයෙහි රක්ෂාවක් කිරීමට පටන් ගත් කාලය දක්වා වූ වෘත්තීය සුදුසුකම් සවිස්තර ලෙස සඳහන් කරන්න. සහතික පිටපත් ඇමිණිය යුතුය.

6. මෝටර් රථ පැදවීම පිළිබඳ මොනයම් හෝ දැනීමක් තිබේද ? ලොරි, කාර් පැදවීමට සහ මෝටර් සයිකල් පැදීමටත් බලපත්‍රයක් ඔබ සතුව ඇද්ද ? :————.

7. වෙනත් විශේෂ සුදුසුකම් :————.

8. දැනට කරන රැකියාව :————.

9. ඔබ කිසියම් දිනක ආණ්ඩුව යටතේ සේවය කොට තිබේද ? එසේ නම්, එම කාල පරිච්ඡේදයන් සහ ඒ පිළිබඳ විස්තරද දෙපාර්තමේන්තුව සහ දරූ තනතුරද, එම දෙපාර්තමේන්තුවෙන් ඉවත්ව යෑමට හේතුවූ කරුණු යනාදියද සඳහන් කරන්න :————.

10. චරිත සහතික ලබාගත් තැනැත්තන් දෙදෙනාගේ නම්, ලිපිනයන් සහ පදවි නාම (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.

11. ලංකා පොලිස් සේවයේ, රියැදුරු හෝ කොස්තාපල් තනතුරක් සඳහා ඔබ මීට පෙර ඉල්ලුම් කොට තිබේද ? එසේ නම්, ඉන් ලැබුණ ප්‍රතිඵලය කුමක් ද ? හැකි නම් ඒ පිළිබඳ ලිපි යොමුව සඳහන් කරන්න :————.

12. ඔබ හෝ ඔබගේ කිසියම් ඥාතියෙකු යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් නඩුවකට පැටලී, උසාවියකට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ දඬුවම් ලබා හෝ ඇද්ද ? :————.

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් ප්‍රකාශ කරමි. ඉහත සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත්, පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය (මා පත් කරනු ලැබුවහොත්) එකෙනෙහිම අවසන් කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.
දිනය :————.

1–360—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාලයන්හි අභ්‍යාස ආචාරිනී තනතුර

කාන්තා ගුරු විද්‍යාලයක අභ්‍යාස ආචාරිනී තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර 64.2.8 දින හෝ එම දිනට පෙර කොම්පඤ්ඤ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගු. වි. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් භාර ගනු ලැබේ.

**2. වැටුප් ක්‍රමය.**—මේ තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,060—7 × 120—8 × 180 සහ 2 × 240—රු. 5,820 වේ.

**3. අවශ්‍ය අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම්.**—

(i) ඉල්ලුම්කරුවන් උපාධිධාරිනියන් වී ඉන්පසු තෙවසක ඉගැන්වීමේ පළපුරුද්දක් ලැබ සිටින්නන් හෝ ද්විතීයික ගුරු පුහුණුවක් ලැබ සිටින්නන් යටත් පිරිසෙයින් පස්වසක ඉගැන්වීමේ පළපුරුද්දක් පුහුණුවීමෙන් පසු ලබා සිටිය යුතුය. ඉල්ලුම්කරුවන් දෙමළ භාෂාවෙන් මනා සුදුසුකම් ලබා විද්‍යාව ඉගැන්වීමේ ප්‍රවීණ විය යුතුය.

(ii) 1964.2.8 වැනි දිනට ඉල්ලුම්කරුවන් වයසින් අවුරුදු 25 ට අඩු හෝ 50 වැඩි හෝ නොවිය යුතුය. රජයේ සේවයේ නියුක්ත නිලධාරිනීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව නොයෙදේ.

**4. විශේෂ කොන්දේසි.**—

(i) තෝරාගනු ලබන ඉල්ලුම්කරු දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයක සේවය කළ යුතුය. දැනට අළුත්ගම කාන්තා ගුරු විද්‍යාලයේ පුරප්පාඩුවක් ඇති බැවින් සුදුසුකම් ලැබූ අයදුම්කරු අළුත්ගම ගුරු විද්‍යාලයට හෝ වෙන ගුරු විද්‍යාලයකට පත් කරනු ලැබේ.

(ii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර සඳහා තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ශික්ෂකයන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නෙකු පත් කරනු ලැබුවහොත් ඇය මෙම තනතුර දරන තෙක් මෙම තනතුර විශ්‍රාම සහිතයයි ප්‍රකාශ කරනු ලැබේ.

(iii) මෙහි පහත සඳහන් කරනු ලබන ආදර්ශ පත්‍රයට අනුව ඉල්ලුම් පත්‍ර නියමිත පෝරමයෙන් ඉදිරිපත් කළ යුතුය. මෙම කාර්යාලය මගින් ඉල්ලුම් පත්‍ර සපයනු නොලැබේ. දැන්වීමේ සඳහන් කර ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අයදුම්කරුවන් විසින් පිටපත් කරගත යුතුය.

5. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) ඡේදයේ පටන් ගැනීමේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන කොන්දේසි බලනු මැනවි.

ඩී. ඇම්. හෙට්ටිආරච්චි,
වැ. බ. අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංකය : ගුවිඑ. 4224
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය, 64.1.6 දින.

## ආදර්ශ පෝරමය

### කාන්තා ගුරු විද්‍යාලයක අභ්‍යාස ආචාරිනී තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. 1964.2.8 දිනට නිවැරදි වයස :— අවුරුදු :——, මාස :——, දින :——.

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඇගේ පියා :————.

(ඇ) ඇගේ පියාගේ පියා :————.

(ඈ) ඇගේ පියාගේ පියාගේත් පියා :————.

6. ලබාගත් දින සමඟ අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :————.

7. වෘත්තීය සුදුසුකම් :————.

8. ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාලය (ඇතුළත් වූ හා අස් වූ දින සඳහන් කරන්න) :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :—

පාසැලේ හෝ විද්‍යාලයේ නම :————.

ඇතුලත් වූ දිනය :————.

අස් වූ දිනය :————.

දරූ තනතුර :————.

සේවා කාලය :— අවුරුදු :——, මාස :——, දින :——.

අස්වීමට හේතු :————.

10. දෙමළ භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල. සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් පිළිබඳ මෙය අනවශ්‍යය :————.

12. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා විසින් නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා පත් කිරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුවහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකරනු ලැබීමට යටත් බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–380—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## ගුරු විද්‍යාලයන්හි නිවාසාධිකාරි සහ සහකාර නිවාසාධිකාරි (පිරිමි) තනතුරු

රජයේ ගුරු විද්‍යාලයන්හි නිවාසාධිකාරි සහ සහකාර නිවාසාධිකාරි (පිරිමි) තනතුරු සඳහා 1964.2.5 දින තෙක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගු. වි. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයා විසින් පහත දක්වනු ලබන ආකෘති පත්‍රයට අනුව නියමිත පෝරමයෙහි එවනු ලබන ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. **වැටුප් හා දීමනා.**—මේ තනතුරු සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රම මෙසේ ය :—

නිවාසාධිකාරි තනතුර—රු. 1,980 — 11 × 120—රු. 3,300.
සහකාර නිවාසාධිකාරි තනතුර—රු. 1,464—17 × 72—රු. 2,688.

ගෙවල් කුලී දීමනා ගෙවනු නොලැබේ. එහෙත් රජයේ රෙගුලාසි අනුව තාවකාලික ජීවන වියදම සහ විශේෂ ජීවන වියදම ද ගෙවනු ලැබේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කළ දින සිට වැටුපෙන් සියයට 4 බැගින් වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අවශ්‍ය අධ්‍යාපනික හා අනිත් සුදුසුකම්.**— සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු පිළිබඳව සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන වූ හෝ උසස් සුදුසුකම් ලබා, සිංහල පිළිබඳ හොඳ දැනුම ඇති විය යුතුය,

(ii) අයදුම්කරුවන් විසින් නේවාසිකාගාර හෝ ශිෂ්‍ය නිවාස පාලනයෙහි පළපුරුද්දක් ලබා සිටිය යුතුය. ලෙඩුන් සාත්තු කිරීම හා ප්‍රථමාධාර දැනුම හෝ සහතික ලබා තිබෙන අය ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ,

(iii) 1964.2.5 වැනි දිනට වයසින් අවුරුදු 25 ට අඩු හෝ අවුරුදු 50 ට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව නොයෙදේ.

5. **සේවා කොන්දේසි.**—(i) පත්වීම අවුරුදු තුනක සේවා සෝදිසි කාලයකට යටත් වේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් ශිෂ්‍ය නිවාසයේම පදිංචි විය යුතුය.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් ඇප මුදලක් තැන්පත් කළ යුතුය.

(iv) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා ආඥාපනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා දැනටම සකස් කර තිබෙන හෝ මතුවට සකස් කරනු ලබන හෝ නියමයන් තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් අනුගමනය කිරීම අවශ්‍යය.

6. **විශේෂ කොන්දේසි.**—(i) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයක සේවය කළ යුතුය. දඹදෙනිය, ඇස්වත්ත, මීරිගම, කටුකුරුන්ද සහ බලපිටිය ගුරු විද්‍යාලයන්හි ඇබෑර්තු ඇති බැවින් සුදුසුකම් ලැබූ අය මේ ගුරු විද්‍යාලවලට හෝ වෙන ගුරු විද්‍යාලවලට හෝ පත් කරනු ලැබේ.

(ii) නියමිත පෝරමයෙහි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරම මෙම කාර්යාලය මගින් සපයනු නොලැබේ. දැන්වීමේ පළකරනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපතක් අයදුම්කරුවන් විසින් පිටපත් කරගත යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම්වලට අදාල සාමාන්‍ය කොන්දේසි වෙත ද අවධානය යොමු කරනු ලැබේ.

ඩී. ඇම්. හෙට්ටිආරච්චි,
වැඩ බලන අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙනුවට.

අංක : ගුවිඑ. 4210,
කොළඹ 2, මැල් වීදියේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුව, 64.1.10.

### ආදර්ශ පෝරමය

### ගුරු විද්‍යාලයන්හි නිවාසාධිකාරි හා සහකාර නිවාසාධිකාරි (පිරිමි) තනතුරු

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. 64.2.5 දිනට නියමිත වයස :——. අවුරුදු :——. මාස :——. දින :——.
4. ජාතිය හා එය ලබා ගත් අයුරු :————.
5. උපන් ස්ථානය :—
   (ඒ) අයදුම්කරු :————.
   (බී) ඔහුගේ පියා :————.
   (සී) ඔහුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (ඩී) ඔහුගේ පිය පාර්ශ්වයේ මීමුත්තා :————.
6. අධ්‍යාපන සුදුසුකම්, ලබා ගත් දිනයන් ඇතුළුව (ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය) :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. දැනට නියුතු රැකියාව :————.
9. නේවාසිකාගාර හෝ ශිෂ්‍ය නිවාස පාලනය පිළිබඳ පළපුරුද්ද : ————.
10. සිංහල පිළිබඳ සුදුසුකම් :————.
11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් සහ තනතුරු :————.
    (මුල් සහතික නොව පිටපත් තුනක් ඇමිණිය යුතුය. රජයේ සේවයේ නියුක්තවූවන්ගෙන් සහතික අනවශ්‍යය.)
12. වෙනත් විස්තර :————.

මෙම අයදුම්පතෙහි මවිසින් ඉදිරිපත් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැන ගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වන බවත්, පත් කරනු ලැබුවායින් පසු හෙළිවුවහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–455—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

අංකය : ශිෂ්‍ය/387.

## අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශය

### 1964-65 පකිස්තාන් පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ, පහත සඳහන් විෂයයන්හි පකිස්තානයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා පකිස්තාන් රජය විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

ඉස්ලාම් අධ්‍යයනය.
උර්දු භාෂාව.
පුරාවිද්‍යාව.
කෘෂිකර්මය.
අරාබි භාෂාව.
භූගර්භ විද්‍යාව.
භූගෝල විද්‍යාව.
අධ්‍යාපනය.

(පුරා විද්‍යාව පිළිබඳ පාඨමාලා කිසිම විශ්ව විද්‍යාලයක නැත. එහෙත්, ඒ විෂයය සඳහා අපේක්ෂකයකු වෙත් නම්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ඔහුට පර්යේෂණ කටයුතු භාරගත හැක.)

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්‍ෂය.**—1. රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණ ය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්‍ෂය.**—2. මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 23 වැනි

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### කෑගල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ වාණිජ විෂයයන් පිළිබඳ තාවකාලික අර්ධ කාලීන උපදේශක තනතුරු (සම්පූර්ණ කාලීන පදනම උඩ)

මෙම දෙපාර්තමේන්තුවේ කෑගල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ පහත සඳහන් විෂයයන් ඉගැන්වීම සඳහා තාවකාලික අර්ධ කාලීන උපදේශක තනතුරු වලට (සම්පූර්ණ කාලීන පදනම උඩ) සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ:—

(1) සිංහල භාෂාව
(2) පොත් තැබීම
(3) වාණිජ විද්‍යා මූලධර්ම
(4) වාණිජ භූගෝලය
(5) වාණිජ අංක ගණිතය
(6) යතුරු ලියනය
(7) ලඝු ලේඛනය

ඉහත සඳහන් සියළුම විෂයයන් සිංහලෙන්/ඉංග්‍රිසියෙන් ඉගැන්වීමට හැකි අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. පහත දක්වෙන ආකෘතිය අනුව පිළියෙලවූ ඉල්ලුම් පත් 1964 පෙබරවාරි 3 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුයි.

2. අවම සුදුසුකම්.—(1) ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව මගින් පිරිනමනු ලබන පොත් තැබීම පිළිබඳ උසස් වාණිජ සහතිකය හා/හෝ ලඝු ලේඛක යතුරු ලිවීම පිළිබඳ උසස් වාණිජ සහතිකය හෝ සමාන සුදුසුකම්.

(2) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව.

3. වැටුප්.—මාසික වැටුප රු. 300 (සියළුම දීමනා ඇතුලත්ව).

4. ඉල්ලුම් පත්‍ර සමග සහතික වල මුල් පිටපත් නොඑවිය යුතුයි.

5. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වෙත මිස පුද්ගලික වශයෙන් එම කාර්යාලයේ කිසිවකුට නොවේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්‍ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 ජනවාරි 8.

### තාවකාලික අර්ධකාලීන උපදේශක තනතුරු (සම්පූර්ණ කාලීන පදනම උඩ) සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. වයස හා උපන් දිනය :————.
4. ජාතිය :————.
5. විවාහකද අවිවාහකද යන වග: ————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
7. වෘත්තීය සහ ශාස්ත්‍රීය සුදුසුකම් :————.
8. ඉගැන්වීමේ පලපුරුද්ද :————.
9. දැනට රැකියාවක් කරන්නේ නම් එය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

1–556—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරයන් උදෙසා පැවැත්වෙන ත්‍රෛයිමාසික විභාගය—ජනවාරි 1964

මේ මස පැවැත්වීමට නියමිතව තිබූ ඉහත සඳහන් විභාගය නොපවත්වන බව මෙයින් නිවේදනය කරමි. අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් විභාග පෙරසේම නොනවත්වා පවත්වනු ඇත.

1965 වර්ෂයේ සිට මෙම ත්‍රෛයිමාසික විභාග වෙනුවට අර්ධ වාර්ෂික විභාග පවත්වනු ඇත. මෙම විභාග දෙක පවත්වනු ලබන මාස හා දිනයන් පසුව දන්වනු ඇත.

ඩබ්ලිව්. ඒ. කරුණාරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1–481—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

අංකය 1/23/4/7 (ජී).

### සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතික භාෂාවන් හා ගිණුම් පරීක්ෂණය

අංක 13,863 හා 63.12.20 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 63.12.16 වැනි දින දරණ නිවේදනයට වැඩිමනත් වශයෙනි. 1963 අගෝස්තු 20 වැනි දින සිට 24 වැනි දින දක්වා පවත්වන ලද සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ ව්‍යවස්ථාවේ "සී." උපග්‍රන්ථයේ නියමකර ඇති සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් අපේක්ෂකයා සමත්වී ඇති බැව් පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ:—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| සර්පන්ච්, ඩො. ප්‍රා. | ... | දේශීය ආදායම් |

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1964 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

1–518—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

අංකය : 1/23/4/7 (ජී).

### සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතික භාෂාවන් හා ගිණුම් පරීක්ෂණය

අංක 13,863 හා 63.12.20 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත කී පරීක්ෂණය පිළිබඳ අංක 1/23/4/7 (ජී) හා 63.12.16 වැනි දින දරණ සිංහල නිවේදනයේ 2 වැනි ඡේදයේ නම් ලැයිස්තුවට පහත සඳහන් නම අඩංගු කරනු ලැබේ:—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| මැදගොඩ, හෙ. මු. වි. බ. | ... | ගොවිජන සේවා. |

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩබලන නියෝජ්‍ය ලේකම්.

1964 ජනවාරි 11 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

1–888—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මුලතිව් උප කොට්ඨාශයේ මුත්තයින් කඩ්ඩුකුලමේ වැව් වේල්ල ඉස්සීම හා වේල්ලේ කැඩුම් බිඳුම් පිරවීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයැදුම් පත්, කොළඹ. තැ. පෙ. අංක 500, මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 පෙබරවාරි මස 18 කුජ දින පූ. භා. 10 වන තෙක් භාර ගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 5,00,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ පස් වැඩ කිරීමට යෝග්‍ය යන්ත්‍ර ඇති කොන්ත්‍රාත් කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

වවුනියාවේ උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම, අනුපිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් 250ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුළ 1964 පෙබරවාරි මස 14 වැනි කිවි දින හෝ ඊට පෙර වවුනියාවේ උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

මේ ගැන වැඩි විස්තර වවුනියාවේ උතුරු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එන්. පෙරියතම්බි,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1964.1.1 දින, කොළඹ දී ය.

1–408—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කළුතර උප කොට්ඨාශය

කටදොර පිහිටි මිදෙල්ලගහ ඇස්වැද්දුම අමුණ යෝජනා ක්‍රමය—අමුණ නිර්මාණය කිරීම, අංශ බැමි තැනීම සහ සොරොව් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 12 වැනි බදාදා පෙරවරු 11 දක්වා කොළඹ 8, කෝට්ට පාරේ පිහිටි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 10 වැනි දින තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී කළුතර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඞ්ලයෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුසි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඞ්ලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායඞ්ලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ලෙ. උ. වීරකෝන්,
කළුතර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු.

කළුතර, 1963.12.27.

1–424—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—බදුල්ල උප කොට්ඨාශය

බදුල්ල උප කොට්ඨාශයේ අඹේවෙල ව්‍යාපාරයේ වැඩ සඳහා 1964 පෙබරවාරි 5 වැනි බදාදා පෙරවරු 10 වනතෙක් බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එහිදී එවෙලේම සිදුකරනු ලැබේ.

| | සේවා විස්තර | කොන්ත්‍රාත් කරුගේ ලියා පදිංචි වටිනාකම රු. ශ. | | ටෙන්ඩර තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 1. | අඹේවෙල ව්‍යාපාරයට ¾" කළුගල් සැපයීම | 25,000 0 | ... | 25 0 |
| 2. | එම 1½" හා 1" ගල් සැපයීම | 20,000 0 | ... | 25 0 |
| 3. | එම සක්කගල් හා වැලි සැපයීම | 15,000 0 | ... | 25 0 |

2. 1964 පෙබරවාරි 3 වැනි සඳුදා දහවල් 12 වනතෙක් බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයෙන් ලබාගතහැකි ටෙන්ඩර් පත්‍රවල අයැදුම් සකස්කල යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට වැඩ සඳහා ටෙන්ඩර් කිරීමට සුදුසුද නැද්ද යන්න සලකා බැලීම සඳහා බදුල්ල වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළයුතුය.

3. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම එක එක වැඩය සඳහා රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සිය ඉදිරිපත් කළයුතුය.

4. මේ සඳහා සියළුම වැඩි විස්තර, ගිවිසුම් ආදිය කාර්යාලීය වේලාවන් තුළදී බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගතහැක.

ජේ. ගුණසේකර,
බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තැන.

1964 ජනවාරි 7,
බදුල්ල වාරිමාර්ග කායඞ්ලයේ දී.

1–550—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනියාව උප කොට්ඨාශය

ඉලන්කාතකුලම වැඩිදියුණු සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 11 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා වවුනියාව උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේ ම එහි දී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 7 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල දී වවුනියාවේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුසි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලැසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුල දී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වී. කුමාරස්වාමි,
වවුනියාව උප කොට්ඨාශය.

වවුනියාව, 1964.1.9.

1–553—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනියාව උප කොට්ඨාශය

වවුනියාව වැවේ විශේෂ නඩත්තු වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 11 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා වවුනියාව, උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහි දී සිදු කෙරේ.

2. වාරිමාගී දෙපාතීමේන්තුවේ රුපියල් 40,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 7 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල දී වවුනියාවේ වාරිමාගී ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාගී වැඩ හා ඒ වායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලැසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුල දී වාරිමාගී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වී. කුමාරස්වාමි,
වවුනියාව උප කොට්ඨාශය.

වවුනියාව, 1964.1.9.

1–554—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනියාව උප කොට්ඨාශය

සින්නපරන්තන්කුලම වැඩි දියුණු සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 11 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා වවුනියාව, උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහි දී සිදු කෙරේ.

2. වාරිමාගී දෙපාතීමේන්තුවේ රුපියල් 35,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 7 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල දී වවුනියාවේ වාරිමාගී ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාගී වැඩ හා ඒ වායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාගී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාගී ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලැසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුල දී වාරිමාගී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වී. කුමාරස්වාමි,
වවුනියාව උප කොට්ඨාශය.

වවුනියාව, 1964.1.9.

1–555—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කුරුණෑගල උප කොට්ඨාශය

වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මාදුල්ල බැම්ම ඉදිකිරීම සඳහා ටෙන්ඩර් 1964 පෙබරවාරි මස 11 වෙනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000කට සහ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවෝ පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු වෙති. කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල දෙපිට පතකින් යුතුව ටෙන්ඩර් පෝර්ම සකස් කළ යුතුයි. කොළඹ වාරි මාර්ග අධ්‍යක්‍ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50ක් තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කර 1964 පෙබරවාරි 7 වෙනි සිකුරාදා දක්වා කාර්යාලයීය වේලාවන් තුළදී ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

3. 1964 පෙබරවාරි මස 11 වෙනි අඟහරුවාදා පෙරවරු 10ට ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

4. ටෙන්ඩර් කොන්දේසි ඇතුළත් වැඩි විස්තර කුරුණෑගල වාරි මාර්ග උප කොට්ඨාශ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
කුරුණෑගල උප කොට්ඨාශය.

1–571—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### ඉරූ ලී විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කැලෑ දෙපාර්තමේන්තුවට අයත් තලාව I, තලාව II අනුරාධපුර, කැබිතිගොල්ලැව, මින්නේරිය, ත්‍රිකුණාමලය, හා චීන වරාය යන දැව ගබඩාවල ඇති ඉරූ ලී තොග කීපයක් විකිණීම සඳහා කොළඹ වන සංරක්ෂක විසින් 1964 පෙබරවාරි මස 6 වෙනි දින උදේ 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. එක් එක් දැව ගබඩාවේ විකිණීමට ඇති දැව සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් ලබාගත යුතුවේ. ටෙන්ඩර් පතක් ලබා ගැනීමට ලංකා බැංකුවේ යෝක් වීදියේ ශාඛාවේ වන සංරක්ෂක නමින්, 34 ගණක අංකයට රු. 100 ක ඇප මුදලක් තැන්පත් කර කොළඹ වන සංරක්ෂක වෙත කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ත්‍රිකුණාමලයේ දිසා වන නිලධාරීගෙන් ටෙන්ඩර් පත් ලබා ගැනීමටද හැක. ඒ සඳහා රු. 100 ක මුදල් ඕඩරයක් ත්‍රිකුණාමලයේ දිසා වන නිලධාරි නමින් ලබාගෙන ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පතක් නිකුත් කරනු ලැබේ.

1964 ජනවාරි මස 31 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කොළඹ වන සංරක්ෂක කායඹාලයයෙන් හෝ ත්‍රිකුණාමලයේ දිසා වන කායඹාලයෙන් හෝ පැමිණ ලබා ගත හැක.

වි. ජෝ. වීරරත්න,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කායඹාලය,
තැ. පෙ. 509,
කිච්පාර,
කොළඹ 2.
1964 ජනවාරි මස 8 වෙනි දින.

1–489—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

කවුඩුලුවැව, මින්නේරිය, ගල් අමුණ, පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය, සත්ව පර්යේෂණ ගොවිපලේ පොදු ගොඩනැගිලි අංශය, පොලොන්නරුව, මධ්‍යම පාසැල පොලොන්නරුව, මදුරුඔය, කන්දකාඩුව යනාදී තමන්කඩුව දිස්ත්‍රික්කයේ පොලොන්නරුව ව්‍යාපාරයතුල පිහිටි අංශයන්ට හා මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි හත්තොට අමුණ ව්‍යාපාරයට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි.

පොලොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ඉහත දැක්වූ ව්‍යාපාරයන්ට පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජනවාරි මස 31 දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ.

(1) පොල් අතු (අඩි 7 කට දිගින් අඩු නොවූ අඟල් 18 ක් පළල් වූ ඉරුදෙකේ පොල් අතු 1000 බැගින්)

(2) අලුහුණු (බුසල් ගණනින්, බුසලක් රු. 44 ට අඩු නොවිය යුතුයි).

(3) තම්බාපු හුණු. (බුසල් ගණනින්)

(4) කලු ගල් (කියුබ් ගණනින්) අඟල් 6″—9″

(5) තලාපු ගල් (කියුබ් ගණනින්) ($\frac{3}{4}$″ සිට 2″ දක්වා)

(6) පිළිස්සූ ගඩොල් ($8\frac{3}{4}'' \times 4\frac{1}{2}'' \times 2\frac{3}{4}''$—1000 බැගින්) (පෝරණුව ව්‍යාපාරයේ සිට සැතපුම් 5 කට වැඩි නොවිය යුතුයි).

(7) ගංගා වැලි (කියුබ් ගණනින්)

2. ගෙනැවිත් භාර දීම සඳහා වෙන වෙනම මිළ ගණන් දැක්විය යුතුයි.

(අ) වත්තෙන්, පෝරනුවෙන්, ගල්වලෙන්, (ලොරිගෙනගිය හැකිවිය යුතුයි)

(ආ) වැඩපලට.

3. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනුමට මත්තෙන් මෙම කාර්යාලයේ හෝ කච්චේරියක හෝ ඒ ඒ ව්‍යාපාරයනට වෙන වෙනම රුපියල් 50 බැගින් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි. 1964 ජනවාරි මස 30 වැනි දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පෝරමයන් නිකුත් කරණු ලැබේ.

4. පිළිගත් ටෙන්ඩර් කරු විසින් මා නියෝගකල දින සිට සති දෙකක් ඇතුලතදී උපකරණ සැපයිය යුතුයි. යමෙක් ඒ පැහැර හැරිය හොත් හෝ අසමත් වුවහොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජ සන්තක වනවාත් හැර ඔහුගේ නමද ආණ්ඩුවේ කොන්දේසි කඩකල කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නේ ය.

5. කැමති ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් විවෘත කරණ වේලාව වන 1964 ජනවාරි මස 31 වැනි දින පෙ. ව. 11 ට ඉදිරිපත් විය හැක.

6. වැඩි විස්තර පොලොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබාගත හැක.

එම්. අයි. එම්. නලීර්,
ඉඩම් සංවර්ධන නිලධාරී,
පොලොන්නරුව.

1964 ජනවාරි මස 3 දින,
ඉඩම් සංවර්ධන කාර්යාලය,
පොලොන්නරුව.

1–483—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## ලුණු දෙපාර්තමේන්තුව

1964 පෙරවාරි මස 10 වැනි දින සිට 1964 දෙසැම්බර් මස 31 වැනි දින වනතුරු මඩකලපුවේ දුම්රිය ස්ථානයේ සිට මඩකලපුවේ ලුණු ගබඩාවට ගෝනිවල අසුරන ලද ලුණු පටවා ගෙන යාම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ අංක 110, තැ. පෙ. 539, දරන ලිපිනයට ලුණු කොමසාරිස් තැන විසින් 1964 ජනවාරි මස 31 වැනි සිකුරාදා පස්වරු 3 වනතුරු බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ මඩකලපුවේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් ලබාගන්නා පෝර්ම කොලවලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 25 ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොල දෙනු ලැබේ. ලුණු කොමසාරිස් කාර්යාලයේ මුදල් තැන්පත් කරන්නේ නම් චැක් පත්වලින් සැපයිය යුතුයි. වැඩි විස්තර ඉහත සඳහන් අයවලුන්ගෙන් ලබාගත හැක.

ජේ. ජේ. ජී. අමීර්තනායගම්,

අංකය ටී. ජී. 91.
1964 ජනවාරි 17 වැනි දින, කොළඹ.

1–531—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1964 මාර්තු 1 වැනි දින සිට 1964 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා, ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කොළඹ හැර, අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු බස්නාහිර පළාතේ ආයතනයන් සඳහා මෙම කාර්යාලයෙන් ද අනික් පළාත්වල ආයතනයන් සඳහා ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුවූ ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයෙ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ " බී " අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහාලේකම් කාර්යාලය, ගාලු මුවදොර, කොළඹ. " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහනලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට (සැපයීම සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගනන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගනන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සිමාව ඉකුත් වනතුරු වළංගු වේ. කොන්ත්‍රාත්

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 පෙබරවාරි මස 7 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| අංක | පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|---|
| 1. | අ/කලුවිල මහ විද්‍යාලය ... | රසායනාගාරයක් තැනීම |
| 2. | අ/තැඹම්පහ මහ විද්‍යාලය ... | එම |
| 3. | අ/කිරිගල්වැව මහ විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ලක් සහ ගුරු නිවාසයක් තැනීම |
| 4. | අ/කට්ටියාව යාය 6 මහ විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| 5. | අ/කට්ටියාව යාය 9 මහ විද්‍යාලය | එම |

සංලක්ෂ්‍යය—1. අ=අනුරාධපුර දිස්ත්‍රික්කය

සංලක්ෂ්‍යය—2. අවශ්‍ය ලියාපදිංචි කිරීම

| | අධ්‍යාපන දෙපාර්තමේන්තුව රුපියල් | ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව රුපියල් | අනුමත කළ සමිති සමාගම් රුපියල් |
|---|---|---|---|
| අංක 1 සහ 2 | 22,000 | 22,000 | 22,000 |
| අංක 3 | 20,000 | 20,000 | 20,000 |
| අංක 4 සහ 5 | 17,000 | 17,000 | 17,000 |

2. ඉහත දැක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එම සටහනේ පෙන්වන මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි වූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 පෙබරවාරි මස 6 දින දවල් 12 වනතෙක් නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමා වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර, පොස්ටල් ඕඩර යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීම් පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවෙනි ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලු විස්තර හා තොරතුරු අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමාගෙන් දැන ගත හැකි ය. සැලැස්ම එහි දී බලා ගත හැකි ය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ''ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2'' යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර පත්‍ර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාර දී එසේ භාර ගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතු ය.

එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද වැඩෙහි නමද, ලියා තිබිය යුතුයි.

5. 1964 පෙබරවාරි මස 7 වැනි දින පස්වරු 2.30ට කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණය ද, රේට් ගණන් ද, ටෙන්ඩර් කරුවන්ගේ නම් ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුල ස්වකීය ගණන් යෝජනා විවෘත ව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලි ද මෙහි දී පරීක්ෂාකර බැලිය හැක.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නො පුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකි තාක් දුරට බඳවා ගත යුතු ය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් ම බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරණු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතුව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළසේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම් ය.

ඉව්ලින් ප්‍රනාන්දු,
උ.මැ.ප්‍ර. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964 ජනවාරි 8 වැනි දින,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ දීය.

1-482/1—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 පෙබරවාරි මස 7 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| අංකය | පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|---|
| 1. | අ/කට්ටියාව යාය 1 විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම |
| 2. | අ/පාඩිග්ගම විද්‍යාලය ... | එම |
| 3. | අ/සියඹලගස්වැව-වැලාව විද්‍යාලය | එම |
| 4. | අ/මහ ඇහැටුවැව විද්‍යාලය ... | එම |
| 5. | අ/ඇල්ලෙවැව විද්‍යාලය ... | එම |
| 6. | අ/මුඩපෙරුම්ගම විද්‍යාලය ... | එම |
| 7. | අ/නාවක්කුලම විද්‍යාලය ... | එම |
| 8. | අ/මැදගම විද්‍යාලය ... | එම |
| 9. | අ/මහපොතාන දිවුල්වැව විද්‍යාලය | එම |
| 10. | අ/මහබෝධි විද්‍යාලය | පූර්වටු යකඩ ගොඩනැගිල්ලක් තැනීම (ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව සපයති) |
| 11. | අ/දුනුපොතගම විද්‍යාලය ... | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| 12. | අ/මහගල්කන්දෙගම විද්‍යාලය ... | එම |
| 13. | අ/සේනපුරමහ විද්‍යාලය ... | එම |
| 14. | අ/වික්කන්පොතාන විද්‍යාලය ... | එම |
| 15. | අ/වාගොල්ලැකඩ විද්‍යාලය ... | එම |
| 16. | අ/මහවැව-ගෝනැව විද්‍යාලය ... | වහලයට ඇලුමිනියම් කහඩු සෙවිලි කිරීම |

සංලක්ෂ්‍යය—1. අ=අනුරාධපුර දිස්ත්‍රික්කය

සංලක්ෂ්‍යය—2. අවශ්‍ය ලියාපදිංචි කිරීම

| අංකය | අධ්‍යාපන දෙපාර්තමේන්තුව රුපියල් | ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව රුපියල් | අනුමත කළ සමිති සමාගම් රුපියල් |
|---|---|---|---|
| 1 | 12,000 | 12,000 | 12,000 |
| 2–5 | 11,000 | 11,000 | 11,000 |
| 6–10 | 10,000 | 10,000 | 10,000 |
| 11–13 | 8,000 | 8,000 | 8,000 |
| 14–15 | 6,000 | 6,000 | 6,000 |
| 16 | 5,000 | 5,000 | 5,000 |

2. ඉහත දැක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එම සටහනේ පෙන්වන මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ කළ හැකි බවට සමුපකාර රෙජිස්ට්‍රාත් තුමාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ සහතිකයක් අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමාට ඉදිරිපත් කළ හැකි විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාමසංවර්ධන සමිතිවලට හා කම්කරු සමිති වලට ද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 පෙබරවාරි 6 වැනි දින දවල් 12 වනතෙක් නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමා වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර, පොස්ටල් ඕඩර යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීම් පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වෙනි

ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවෙනි ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලු විස්තර හා තොරතුරු අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තුමාගෙන් දැන ගත හැකි ය. සැලැස්ම එහි දී බලා ගත හැකි ය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, අනුරාධපුරය" යන ලිපිනයට රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර පත්‍ර ලියාපදිංචි කරන ලද තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාර දී එසේ භාර ගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතු ය.

එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද, වැඩෙහි නමද ලියා තිබිය යුතුයි.

5. 1964 පෙබරවාරි මස 7 වැනි දින පස්වරු 2.30ට අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථාන යේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිළධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණය ද, රේට් ගණන් ද, ටෙන්ඩර්කරුවන්ගේ නම් ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාළයක් තුල සවකීය ගණන් යෝජනා විවෘත ව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර අනුරාධපුර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලි ද මෙහි දී පරීක්ෂාකර බැලිය හැක.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නො පුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකි තාක් දුරට බඳවා ගත යුතු ය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් ම බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතුව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළසේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම් ය.

ඉවලින් ප්‍රනාන්දු,
උ.මැ.ප්‍ර. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964 ජනවාරි 8 වැනි දින,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ දීය.

1–482/2—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

### අළු හුණු සැපයීම හා බෙදාහැරීම

1964 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා පෙරවරු 10.30 දක්වා රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා පහත සඳහන් වැඩ පළවලට අළුහුණු සැපයීම හා බෙදා හැරීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. මෙදින පෙරවරු 11ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ කාමරයට පැමිණ සිටිය හැක.

**අළුහුණු සඳහා විශේෂ විස්තර :**—ජලය ප්‍රතිකාර කිරීමට අවශ්‍ය අළුහුණු හො. 1ටත් හො. 2ටත් අතර, බර ඇති ගෝණි මළුවල සැපයිය යුතුය. එම අළුහුණු වල සියයට අනූවක (90%) ප්‍රමාණයක් පිරිසිදු කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් තිබිය යුතු අතර, අඩුම වශයෙන් හයිඩ්‍රොක්ලෝරික් ඇසිඩ්වල දිය කළ හැකි ද්‍රව්‍යය සියයට අනූ අටක් (98%) තිබිය යුතු වේ. එම හයිඩ්‍රොක්ලෝරික් ඇසිඩ්වල දිය කළ නොහැකි අපවිත්‍ර දෑ සියයට දෙකක් (2%) වඩා වැඩි නොවිය යුතුය.

අළුහුණු පහත සඳහන් ස්ථානයන්ට 1964 දෙසැම්බර් මස 31 දක්වා භාර දිය යුතුය. එක් එක් ස්ථානයක් සඳහා දක්වා ඇති ප්‍රමාණය තුන් මසකට අවශ්‍ය ප්‍රමාණය වේ.

(1) මීගමුව ජලසම්පාදන ක්‍රමය—බම්බුකුලිය ජල මධ්‍යස්ථානය—හො. 100යි.

(2) මාතර ජල සම්පාදන ක්‍රමය—නාදුගල ජල මධ්‍යස්ථානය—හො. 120යි.

(3) අනුරාධපුර ජලසම්පාදන ක්‍රමය—පෙරනාගාරය ජල මධ්‍යස්ථානය—හො. 58යි.

(4) තංගල්ල ජල සම්පාදන ක්‍රමය—නලගම ජල මධ්‍යස්ථානය—හො. 27යි.

(5) හම්බන්තොට ජලසම්පාදන ක්‍රමය—අම්බලන්තොට ජල මධ්‍යස්ථානය—හො. 27යි.

පරීක්ෂා කිරීම සඳහා ටෙන්ඩර් ලිපි ද්‍රව්‍ය රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ තබා ඇත. ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තුමාට (නිර්මාන හා නඩත්තු) ටෙන්ඩර් පත්‍ර එවන ටෙන්ඩර් කරුවන්ට රු. 25 තැන්පත් කොට මෙම දෙපාර්තමේන්තුවෙන් හෝ ඕනෑම කච්චේරියකින් ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු මීට අදාල ටෙන්ඩර් ලියකියවිලි සපයනු ලැබේ. ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල ටෙන්ඩර් කොන්දේසි අනුව ආපසු ගෙවනු ලැබේ.

පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම අධ්‍යක්ෂක තැන විසින් අනුමත කරන ලැබූ ග්‍රාම සංවර්ධන සමිති සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

පුරවා එවිය යුත්තේ ඉහත සඳහන් අයුරින් ලබාගත් ටෙන්ඩර් ආකෘති පත්‍රවලය. 1964 ජනවාරි මස 31 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

සී. රාසයියා,
ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ.

ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව,
රත්මලාන, 1964 ජනවාරි 9 වැනි දින.

1–539—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## ටැන්ඩර් දැන්වීමයි

ගෙවල් 21 කින් ද, වැසිකිළි 21 කින් ද, ළිං 2 කින් ද සමන්විත ධීවර කාර්මිකයින්ගේ නිවාස යෝජනා ක්‍රමයක් හික්කඩුව නගරයේ තැනීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක රුපියල් 75,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විසින්, පිට පතක් ද සහිතව ඉදිරිපත් කෙරෙන සීල් තැබූ ටෙන්ඩර් 1964 ජනවාරි මස 30 වැනි දින දවල් 12 වන තෙක් හික්කඩුව සුළු නගර සභාවේ සභාපතිවරයා විසින් භාරගනු ලැබේ.

රුපියල් 250 ක ටැන්ඩර් තැන්පත් මුදලක් හා රුපියල් 10 ක ටැන්ඩර් පෝර්ම ගාස්තුවක් ද ගෙවා මෙම කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්මවල පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964.1.27 දින පස්වරු 2.30 වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කාර්යාල වේලාවන්හිදී නගර සභාවේ ලේකම්වරයාගෙන් දැනගත හැක.

ඒ. පී. පියදාස,
වැඩ බලන සභාපති.

හික්කඩුව සුළු නගර සභාව,
1964 ජනවාරි මස 4 වැනි දින දීය.

1–399—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර දැන්වීමයි

බොරලැස්ගමුවේ, වේරහැර ප්‍රධාන වැඩපොලෙහි වැසි එකලස් කිරීමේ අතිරේක වැඩමඩුවක් තැනීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහිවූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1964 පෙබරවාරි මස 12 වෙනි බදාදා පෙ. ව. 10.00 වනතෙක් භාරගනු ලැබේ. වැඩි විස්තර බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගෙන් ලබා ගත හැකවේ.

රුපියල් 30,000 ක් හා ඊට වැඩියෙන් යන කර්මාන්ත සඳහා ලංගම සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ලියා පදිංචි කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ වෙති. ඔවුන්ගේ සහතික පත්‍ර ආදිය ඉංජිනේරු මහතා අනුමත කලහොත් ටෙන්ඩරකරුවා විසින් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රුපියල් 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ යුතුයි. තැන්පත් කළ මුදල් වෙනුවෙන් ලැබුන කුවිතාන්සිය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගේ කාර්යාලයට ඉදිරිපත් කළවිට ඒ මහතා විසින් 1964 රේ පෙබරවාරි මස 8 වෙනි සෙනසුරාදා දවල් 12.00 වනතෙක් ටෙන්ඩර පෝරම කොල දෙනවා ඇත.

ලංකා ගමනාගමන මණ්ඩලයෙන් සපයන ටෙන්ඩර පෝර්මවල ඉදිරිපත් කරන ටෙන්ඩර පමණක් පිළිගනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1964 ජනවාරි මස 9 වෙනි දින,
කොළඹ 5, නාරාහේන්පිට
කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහිදීය.

1–566—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි

කොළඹ චාමස් ධාන්‍යාගාරයේ තිබෙන 1,25,000ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 7 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා අංක : 330 යුනියන් පෙදෙසේ, කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

රු. 500ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම් වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුයි. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කල විට ලබා ගත හැකි වේ.

කේ. බී. දිසානායක,
ආහාර කොමසාරිස්.

1964.1.10,
කොළඹ 330, යුනියන් පෙදෙසේදීය.

1–491—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1964 පෙබරවාරි මස 12 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ වඩු මඩුවට කොස් සහ අඹ 1,000ක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1964 පෙබරවාරි මස 12 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොල ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 පෙබරවාරි මස 10 වෙනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍ය වී නම් එය සෑපයීමට ටෙන්ඩර්කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඇල්. ඇස්. ද සිල්වා,
වරායෙ කොමසාරිස් වෙනුවට.

1964. 1. 8,
කොළඹ, වරාය **කොමිෂන් කාර්යාලයේදීය.**

1–438—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1964 පෙබරවාරි මස 6 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට අවුට් බෝඩ් මෝටර්ස් 2 ක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1964 පෙබරවාරි මස 6 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොල ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 පෙබරවාරි මස 5 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරායෙ කොමසාරිස් වෙනුවට.

1964.1.9
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

1–488—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## කිරි මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීම

මව්සින් අයිස් වොක්වලට චොකලට් ආලේප (චොකලට් කවචර්) රු. 10,000ක් සැපයීම සඳහා 1964 පෙබරවාරි මස 26 වැනි බදාදා පස්වරු 2 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

ආපසු දෙනු ලබන රු. 150 මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගන්නා කුවිතාන්සිය මෙම කාර්යාලයේ මාණ්ඩලික සහකාර වෙත ඉදිරිපත් කරන අයට ටෙන්ඩර් පත්‍ර 1964 පෙබරවාරි මස 25 වැනි දින පස්වරු 3 දක්වා නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර ඉහත සඳහන් නිලධාරි තැනගෙන් ලබා ගත හැක.

ඇම්. බී. සල්මන්,
සභාපති,
කිරි මණ්ඩලය.

ප්‍රධාන කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 5,
64.1.10.

1–493—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## මාතර දිස්ත්‍රික්කය—මොරවක් කෝරලය

### රජයේ ඉඩම්වල මැණික් ගැරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව උපලේඛනයෙහි විස්තර වන රජයේ ඉඩම් කැබලිවල 1964 පෙබරවාරි මස 15 වැනිදා සිට 1965 පෙබරවාරි මස 14 වැනිදා දක්වා වූ වර්ෂය තුළ මැණික් ගැරීමේ අයිතිය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

### කොන්දේසි

1. බදු මිළ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. එක් එක් කැබැල්ල සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

3. මාතර දිසාපති කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. එක් ආකෘති පත්‍රයක් සඳහා අයදුම්කරු විසින් රුපියල් 5ක් මාතර දිසාපති කාර්යාලයයේ පළමුවෙන් තැන්පත් නොකළහොත් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ. තැන්පත් කළ මුදල සඳහා ලැබෙන කුවිතාන්සිය එයට සම්බන්ධ ආකෘති පත්‍රයට අමුනා එවිය යුතුයි. නරක අදහසින් හෝ රජයට අනවශ්‍ය වියදම් ඇති කිරීමට හෝ දුෂ්කරතාවයකට පත් කිරීමට ටෙන්ඩර් ඉදිරිපත් නොකළේ යැයි දිසාපති සළකන්නේ නම්, බදු විකිණීමෙන් පසු මෙම තැන්පත් මුදල අයදුම්කරුට ආපසු දෙනු ලැබේ. වෙනත් පිළිවෙළකට ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් ගැන සළකා බලනු නොලැබේ.

4. "මැණික් ගැරීමේ අයිතිය සඳහා ටෙන්ඩරය" යන්න ලියන ලද සිල් තැබූ කවරයක බහාලන ලද ටෙන්ඩර මාතර දිසාපති කාර්යාලය යේ දී 1964 ජනවාරි මස 31 වැනි දින ඒවා විවෘත කරන වේලාව වූ පෙරවරු 10 දක්වා භාර ගනු ලැබේ. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කොට එවිය යුතු යි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී සියළුම ටෙන්ඩර් කරුවන් පුද්ගලිකව හෝ තමන්ගේ නියමිත බලය ලත් නියෝජිතයින් මගින් පෙනී සිට, අවශ්‍ය වුවහොත් එම ටෙන්ඩර් පත්‍ර හොඳ අදහසින් ඉදිරිපත් කරන ලද ඒවා බවට දිසාපති තැන තෘප්තිමත් කළ යුතු යි.

5. ටෙන්ඩර් කරනු ලබන මුදල අකුරින් සහ ඉලක්කමින් සඳහන් කළ යුතුයි. මේ අවශ්‍යතාවයට එකඟ නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට දිසාපති තැනට පිළිවන.

6. කිසිම හේතුවක් නොදක්වා යම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තැන විසින් තමන් වෙත තබාගනු ලැබේ.

7. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු තමාට දැනුම් දී සතියක් ඇතුළත ටෙන්ඩරයේ සඳහන් මුළු මුදල සහ ටෙන්ඩර් පිළිගත් එක් කැබැල්ලක් සඳහා ඇප වශයෙන් මුදලින් රුපියල් සියයක් (100) දිසාපති තුමාට ගෙවිය යුතුයි. මෙම මුදල් ගණනින් එකක්වත් නොගෙවා සිටියහොත් විකිණීම අවලංගු කොට එම ටෙන්ඩර් කරු විසින් තැන්පත් කරන ලද කිසියම් මුදලක් වේ නම් දිසාපති තුමා විසින් එය රාජසන්තක කරනවා ඇත.

8. ඉහත සඳහන් 7 වෙනි ඡේදයෙන් නියමිත මුදල් ගෙවීමකින් පසු තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් මුදල ගෙවන ලද කැබැල්ල හෝ කැබලිවල බුක්තිය භාර ගැනීමේ සහ එහි මැණික් ගැරීමේ අයිතිය පවරන ලද බලපත්‍රයක් ලැබීමේ හිමිකම ලැබෙනවා ඇත.

9. සෑම බලපත්‍රයකම අනික් කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසි ද ඇතුළත් වෙනවා ඇත:—

(අ) ටෙන්ඩර්කරුට බුක්තිය භාර දුන් දින සිට අවුරුද්දක කාලය කට බලපත්‍රය වලංගු වනවා ඇත.

(ආ) දිසාපතිගේ ලිඛිත අවසරය නොලබා ඉඩමෙහි ඇති කිසිම ගසක් බලපත්‍ර අයිතිකරු විසින් නොකැපිය යුතු යි.

(ඇ) බලපත්‍රයේ සඳහන් ඉඩමේ හෝ එයට යාව හෝ ඇති දිය පහරෙහි පතුලට හෝ ඉවුරු වලට හෝ බලපත්‍ර අයිතිකරු විසින් නුවුවමනා හානි නොකළ යුතුයි.

(ඉ) බලපත්‍ර කරු හෝ ඔහුගේ කම්කරුවන් විසින් හෝ ඉඩමට හෝ එහි ඇති ගස්වලට සිදුකරන කිසියම් නුවුමනා හෝ අවසර නොලද හානියක් සම්බන්ධව දිසාපති විසින් නියම කරන ලද කිසියම් මුදලක් වන්දි වශයෙන් බලපත්‍ර අයිතිකරු විසින් ගෙවිය යුතු ය.

(ඊ) ඉඩමෙහි මැණික් ගැරීමට තමා බලාපොරොත්තුවන දිනය ගැන භූගර්භ අධ්‍යක්ෂක තැනට බලපත්‍ර අයිතිකරු විසින් නියම දැනුම් දීමක් කළ යුතු යි.

(උ) දිසාපති හෝ භූගර්භ පිළිබඳ අධ්‍යක්ෂ තැන විසින් නිකුත් කෙරෙන ඕනෑම නියමයක් අනුව බලපත්‍රකරු විසින් මැණික් ගැරීම කළ යුතු යි.

(ඌ) දිසාපතිට හෝ භූගර්භ පිළිබඳ අධ්‍යක්ෂකට හෝ ඔවුන්ගෙන් බලය ලත් කවර නිළධාරියකුට හෝ ඉඩමට ඇතුළුවීමට සහ එය පරීක්ෂා කිරීමට බලපත්‍ර අයිතිකරු විසින් ඉඩ දිය යුතුයි.

(එ) කොන්දේසි කඩකිරීම නිසා හෝ මහජන යහපත සඳහා හෝ ඕනෑම විටෙකදී මාසයක් කල් තියා බලපත්‍ර අයිතිකරුට පුද්ගලිකව භාරදෙනු ලබන ලියවිල්ලකින් හෝ බලපත්‍ර අයිති කරුගේ අන්තිමවරට දැන ගන්නා ලද ලිපිනයට හෝ පදිංචි ස්ථානයට හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් යවනු ලබන ලියවිල්ලකින් හෝ ඉඩමේ අලවනු ලබන ලියවිල්ලකින් හෝ දැනුම්දීමෙන් බලපත්‍රය අවලංගු කළ හැක.

(ඒ) බලපත්‍රයේ කාල සීමාව අවසාන වීමෙන් හෝ තීරණය කරනු ලබන කලින් දිනයක හෝ බලපත්‍ර කරු විසින් දිසාපතිතුමා සෑහීමට පත්වන අයුරු ඉඩමේ තමා විසින් හාරා ඇති වළවල් සියල්ලම වසා දැමිය යුතු යි.

10. වැඩි විස්තර සඳහා මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තුමාගෙන් විමසන්න.

### උපලේඛනය

### සඳහන් කරන ලද බිම් කැබලි

1. මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලයේ වැලිවේ නම් ගමේ පිහිටි අංක 10 අවසාන ගම් සිතියමේ හීන්දොල නමැති දිය පාරෙහි පතුළ සමග එහි බස්නාහිර පැත්තෙහි පිහිටි දොල ආරක්ෂිත බිම් තීරයෙන් දම්වැල් එක බැගින් දිග ප්‍රමාණ වූ අංක 1 සිට 11 දක්වා වූ කැබැලි 11ක්.

2. මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලයේ වැලිවේ නම් ගමෙහි පිහිටි අංක 10 දරණ අවසාන ගම් සිතියමේ හීන්දොල නමැති දිය පාරෙහි පතුළ සමග එහි නැගෙණහිර සහ බස්නාහිර පැතිවල පිහිටි දොල ආරක්ෂිත බිම්තීරයන්ගෙන් දම්වැල් එක බැගින් දිග ප්‍රමාණ වූ අංක 12 සිට 37 දක්වා වූ කැබැලි 26ක්.

සැළකිය යුතුයි.—මෙම බිම් කැබැලි පෙන්නුම් කරන අනුරේඛනයක පිටපත් ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග ඉල්ලුම් කරුවනට සපයනු ලැබේ.

හැ. රෝ. අමීච්,
මාතර දිසාපති.

1964 ජනවාරි මස 3 වැනි දින,
මාතර දිසාපති කාර්යාලයයේ දී ය.

1–532—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

### පෝර සහ "වල් පැළෑටි නාසක රසායන" සැපයීම සඳහා ටෙන්ඩර්

කන්තලේ පිහිටි උක්වගාවට පහත සඳහන් දෑ සැපයීම සඳහා ටෙන්ඩර් පත් 1964 ජනවාරි 31 වෙනි සිකුරාදා පෙ. ව. 3.00 දක්වා, කොළඹ 2, ශ්‍රී ජිනරතන පාරේ අංක 48 දරණ ස්ථානයෙහි පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

1. 3—(3-4 ඩයික්ලෝරෝ ෆේපනිල්)—1, 1 ඩයිමෙතිල් යුරියා (ඩී. සී. එම්. යූ.) රාත්තල් 4,800 පමණ.
2. කෘෂිකාර්මික අරමුනු සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස ද්‍රව වශයෙන් සකස් වූ පී. සී. පී.—ගැලුම් 300 පමණ.
3. සියුම් කැටවලින් යුත් සල්ෆේප්ට් ඔෆ් ඇමෝනියා—ටොන් 900 පමණ.
4. උකු ආකාරයෙන් යුත් සුපර් ෆේපාස්පේට්—ටොන් 90ක් පමණ.

නැවත ආපසු ලබාගත හැකි රු. 100ක තැන්පත් මුදලක් ගෙවීමෙන්, කොළඹ 2, ශ්‍රී ජිනරතන පාරේ අංක 48 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව එවිය යුතුය. 1964 ජනවාරි 30 වෙනි දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ. වැඩි විස්තර ලේකම් තැනගෙන් ලබාගත හැක.

සභාපති.

48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2,
1964 ජනවාරි 9 වෙනි දින.

1–487—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ 7, ටොරිංටන් පෙදෙසේ රේස් පිටියෙහි ඉදිකෙරන කර්මාන්ත ප්‍රදර්ශන භූමිභාගයේ පාරවල් සහ තනපිට්ටනි පෙදෙස් වලට බොරලු හෝ වෙනත් අනුමත පිරවීම් ද්‍රව්‍ය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1964 ජනවාරි මස 22 වැනි බදදා පෙරවරු 11 වන තෙක් බාරගනු ලැබේ.

2. විශාල ප්‍රමාණයක පිරවීම් ද්‍රව්‍ය අවශ්‍ය හෙයින් මේ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට කැමති අය කොළඹ 7, ටොරිංටන් පෙදෙසේ රේස් පිටියේ කර්මාන්ත ප්‍රදර්ශණ කටයුතු බාර ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත ලියා යැවීමෙන් අවශ්‍ය විස්තර හා ටෙන්ඩර් පත්‍රද ලබාගත හැකිය.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්‍ෂක වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1964.1.11.

1–523—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### තීරණය කරන ලද ටැන්ඩර් පිළිබඳ විස්තර

| වැඩය | ලැබුණු ටැන්ඩර් ගණන | තෝරාගත් ටැන්ඩර්කරු | පිළිගත් මිළ ගණන රු. ශ. |
|---|---|---|---|
| කො/හැව්ලොක් ටවුන් ම. වි., රෙපරේරුව | 3 | ඇස්. එච්. පුණ්‍යසිරි මහතා | 18,198 15 |
| කො/රාජකීය වි., රෙපරේරුව | 3 | ඇම්. ඇම්. මව්ජුඩ මහතා | 19,494 16 |
| කො/කොතලාවලපුර වි., කර්මාන්ත ශාලාව | 3 | කේ. ඒ. සිල්වා මහතා | 22,020 25 |
| ක/වරකගොඩ ම. වි., රසායනාගාරය | 2 | අගලවත්ත, නැගෙනහිර පස්දුන් කෝරළේ වි. සේ. සමූ. සමිතිය | 19,427 0 |
| ක/වලල්ලාවිට ම. වි., විද්‍යාගාරය | 1 | ඒ. ටී. ජී. ප්‍රනාන්දු මහතා | 48,799 70 |
| ගා/බටේමුල්ල ම. වි., ගොඩනැගිල්ල | 3 | ජී. ඩබ්ලිව්. ජේම්ස් ද සිල්වා මහතා | 29,152 25 |
| මාර/හක්මන මෙතෝදිස්ත වි., ගොඩනැගිලි | 2 | ආර්. ජේ. ද සොයිසා මහතා | 16,820 0 |
| හ/හම්බන්තොට මු. වි., රසායනාගාරය | 1 | ආර්. එච්. ගුණදස මහතා | 20,198 0 |
| මහ/මාඔය වි., ගොඩනැගිලි | 1 | කේ. ඩී. පියදස මහතා | 20,602 50 |
| මහ/එරමුදුලියද්ද ම. වි., ගොඩනැගිලි | 1 | ඇස්. ඇම්. ඒ. මොහමඩ් මහතා | 18,894 50 |
| මහ/යාලෙගොඩ සිද්ධාර්ත වි., ගොඩනැගිලි | 1 | ඇස් ඇම්. ඩී. එඩ්වඩ් අප්පුහාමි මහතා | 16,529 0 |
| මා/අම්බොක්ක වි., ගොඩනැගිලි | 1 | එච්. ඩබ්ලිව්. ද අල්විස් අප්පුහාමි මහතා | 26,246 50 |
| මා/අලකොලවැව වි., ගොඩනැගිලි | 1 | ඩී. ජී. මුදියන්සෙ මහතා | 17,752 50 |
| ර/කරවිට ම. ම. වි., ගොඩනැගිලි | 1 | කේ. ඇම්. සී. තියඹරාවත්ත මහතා | 18,288 0 |
| ර/පලාබද්දල ම. වි., රසායනාගාරය | 1 | ඩබ්ලිව්. ඒ.ඩී. වීරසිංහ මහතා | 44,111 25 |
| ර/කලවාන ම. වි., ගොඩනැගිල්ල | 1 | ඇම්. එච්. තෝමස් අප්පු මහතා | 18,857 0 |
| කෑ/කඳමුල්ල වි , ගොඩනැගිල්ල | 1 | ඒ. ඇම්. අබේරත්න මහතා | 23,620 40 |
| කෑ/වල්ලගොඩ ම. වි. රසායනාගාර සහ ජලනල | 3 | කේ. ආර්. අප්පුහාමි මහතා | 28,170 30 |
| කෑ/හෙට්ටිමුල්ල ම. වි. ගොඩනැගිලි | 4 | ඇම්. ඇල්බට් මහතා | 41,819 0 |
| කෑ/පුස්සැල්ල ගාමිණී වි., ගොඩනැගිල්ල | 4 | ඒ. ඇම්. අබේරත්න මහතා | 21,278 75 |
| කෑ/ගනේතැන්න ම. වි., ගොඩනැගිලි | 4 | ඩබ්ලිව්. ඇම්. පොඩිරාලහාමි මහතා | 20,363 50 |
| කෑ/මාවනැල්ල ම. වි., ගොඩනැගිලි | 6 | කේ. ආර්. අප්පුහාමි මහතා | 20,102 0 |
| කෑ/උඩම්බා සියඹලාපිටිය ම. වි., ගොඩනැගිල්ල | 3 | එච්. ජයකොඩි මහතා | 17,861 75 |
| කෑ/උඩගලදෙනිය වි., ගොඩනැගිලි | 3 | කේ. ආර්. අප්පුහාමි මහතා | 18,151 0 |
| කෑ/අරනායක ම. වි., ගොඩනැගිලි | 5 | එච්. ජයකොඩි මහතා | 17,569 25 |
| කෑ/පන්දෙනිය වි. ගොඩනැගිල්ල | 2 | ඇම්. ඇල්බට් මහතා | 15,965 0 |
| කෑ/වේරගොඩ වි., ගොඩනැගිලි | 3 | ඇම්. ඒ. කිරිබන්ඩා මහතා | 15,725 0 |
| කෑ/වෙනිවැල්කඩුව වි., ගොඩනැගිලි සහ වැසිකිළි | 2 | ඇම්. ඒ. සිම්යොන් සිංඤෝ මහතා | 16,047 0 |
| බ/හිඟුරුගමුව වි., ගොඩනැගිල්ල | 1 | බදුල්ල විවිධ සේවා සමූපකාර සමිති සංගමය | 15,833 50 |
| බ/ගම්පහ මස්පන්න ම. වි., රසායනාගාරය | 1 | ඩී. එච්. ඇම්. සියාතු මහතා | 19,887 75 |
| බ/උඩපේරුව වි. ගොඩනැගිලි | 1 | පී. එච්. ඩී. ධනපාල මහතා | 18,255 50 |
| බ/මල්පොත වි., ගොඩනැගිල්ල | 1 | පී. එච්. ඩී. ධනපාල මහතා | 15,266 25 |
| බ/බිබිලේගම ම. වි., රසායනාගාරය | 1 | පී. එච්. ඒ. ද සිල්වා මහතා | 19,818 75 |
| කු/මහව ම. ම. වි., ගොඩනැගිල්ල | 1 | ඇන්. එච්. සිරිසේන මහතා | 20,828 50 |
| කු/ඉඳුල්ගොඩකන්ද ම. වි., රසායනාගාරය | 1 | ඇම්. වී. සිංඤෝ මහතා | 18,216 75 |
| අ/ඉහල කොඩිතෝක්කුව වි., ගොඩනැගිලි | 2 | ටී. වී. ප්‍රනාන්දු මහතා | 17,053 15 |
| අ/කරවිලගල වි., ගොඩනැගිලි | 1 | පී. ඒ. පීටර් අප්පුහාමි මහතා | 14,567 0 |
| අ/ගාමිණී වැව වි., ගොඩනැගිලි | 1 | ආර්. ඇස්. පෙරේරා මහතා | 20,519 50 |
| අ/ගන්තිරියාගම ම. වි., ගොඩනැගිලි | 3 | ඇස්. ඇම්. ඒ. මොහමඩ් මහතා | 35,612 75 |
| අ/නයාකාපුවැව වි., ගොඩනැගිලි | 1 | ආර්. ඇස්. පෙරේරා මහතා | 18,564 0 |
| අ/හබරණ ම. වි., ගුරු නිවාසය | 1 | ආර්. ඇස්. පෙරේරා මහතා | 18,090 0 |
| පො/බකමූණ ම. වි., රසායනාගාරය සහ ජලනල | 3 | ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ඇස්. ප්‍රනාන්දු මහතා | 45,734 25 |
| පො/කවුඩුල්ල ම. වි., ගොඩනැගිලි | 1 | ඇස්. ඇන්. ඒ. අඳාගල මහතා | 17,199 0 |
| පො/හිඟුරක්දමන ම. වි., කර්මාන්ත ශාලාව | 2 | විල්මට් සහ විලියම්ස් මහතුන් | 22,378 75 |
| පො/බැදිවැව වි., ගොඩනැගිල්ල | 1 | ඇස්. ඇන්. ඒ. අඳාගල මහතා | 16,425 60 |
| පො/විජයබාහුපුර වි., ගොඩනැගිල්ල | 1 | ඇස්. ඇන්. ඒ. අඳාගල මහතා | 16,625 60 |
| ඇම්/කොට්ටම වි., ගොඩනැගිල්ල | 3 | ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු මහතා | 15,693 10 |
| වාමස් ධාන්‍යාගාරයේ සිට ඇදිහැස පිටි ප්‍රවාහන කිරීම කොළඹ ප්‍රදේශය—63/64 | 2 | ඒ. ඇම්. ඒ. කරුණාදස මහතා | 02 |

පී. ජේ. ඒ. ප්‍රනාන්දු,
ටැන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
කොළඹ 2, 1963.12.31.

1-410—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

### ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පහත සඳහන් දිනට කොළඹ යෝක් වීදියෙහි ඔස්ට්‍රේලියා ගොඩනැගිල්ලෙහි තිබෙන අප්‍රයෝජනවත් භාණ්ඩ රැසක් මෙම මස 27 වෙනි දින පූර්ව භාග 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ එම ස්ථානයේ දී විකුණනු ලැබේ. මෙම මස 24 වෙනි සහ 25 වෙනි දිනවල මෙම භාණ්ඩ එම ස්ථානයේ දී බැලිය හැක :—

| | | |
|---|---|---|
| 1. | 10′ × 10′ උලුවස්සක් සහ දොරපලු ... ... ... | 1 යි |
| 2. | බේසන් 22″ × 15″ ... ... ... | 3 යි |
| 3. | සිස්ටර්න් ... ... ... | 1 යි |
| 4. | උළු 6″ × 6″ ... ... ... | 140 යි |
| 5. | යකඩ ගේට්ටු (6′ × 2′ × 6′) ... ... | 1 යි |
| 6. | 8′ × 4′ උලුවහු ... ... ... | 1 යි |
| 7. | ලෑලි කෑලි (ලොරි ප්‍රමාණයෙන්) ... ... | 2 යි |
| 8. | පයිප්ප ½″ සිට 1″ ... ... | අඩි 500 යි |
| 9. | දල් කෑලි (පිත්තල) ... ... ... | 4 යි |
| 10. | යකඩ දල් කෑලි ... ... ... | 1 යි |
| 11. | ස්විච් බෝඩ් ආදී විදුරු වැඩට අදල ලී ගොඩවල් ... | 3 යි |
| 12. | විදුලි කම්බි ගොඩවල් ... ... ... | 3 යි |
| 13. | වෙරස්ට් උළු— | |
| | 4″ × 3′4″ ප්‍රමාණය ... ... ... | 7 යි |
| | 1′8″ × 7′4″ ප්‍රමාණය ... ... ... | 4 යි |
| | 7′9″ × 3′4″ ප්‍රමාණය ... ... | 3 යි |

මුදල් වහාම ගෙවා මෙම උපකරණ දින 3ක් ඇතුළත ගෙන යා යුතුය.

සැ. යු.—මුදල් එම ස්ථානයේදී ම ගෙවිය යුතුයි.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

1964 ජනවාරි මස 10 දින,
කොළඹ 7,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දීය.

1–512—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

### බඩු බාහිරාදිය විකිණීම

#### හිමිකම් නොපෑ තැපැල් භාණ්ඩවල බහා තිබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

ආපසු ලැබුණු ලියුම් කාර්‍යාලයේ තබා ඇති හිමිකම නොපෑ තැපැල් භාණ්ඩ වල බහා තිබූ පහත සඳහන් භාණ්ඩ 1964 ජනවාරි මස 30 දින අපරභාග 1.30 ට කොල්ලුපිටියේ 19 වැනි පටුමාවතේ අංක 20 දරණ ස්ථානයේ පිහිටි ආපසු ලැබුණු ලියුම් කාර්‍යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

සී. කුරෙයිසාමි,
පෝස්ට්මාස්ටර් ජනරාල් වෙනුවට.

1964 ජනවාරි මස 10
මහ තැපැල් කාර්‍යාලයේදීය.
කොළඹ.

| භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තර |
|---|---|
| 1. | රාත්තල් හතලිහ බැගින් ඇති කරදසි මලු හතලිස් පහක් |
| 2. | දෙමළ සඟරා තොගයක් |
| 3. | ආගමික සඟරා තොගයක්. |
| 4. | ඉංග්‍රීසි සඟරා තොගයක්. |
| 5. | ඉංග්‍රීසි සඟරා තොගයක්. |
| 6. | ඉංග්‍රීසි සඟරා තොගයක්. |
| 7. | ඉංග්‍රීසි සඟරා තොගයක්. |
| 8. | ඉංග්‍රීසි සඟරා තොගයක්. |
| 9. | පරණ මුද්දර 20,000 ක් පමණ. |
| 10. | අභ්‍යාස පොත් දුසිම් දෙකක්. |
| 11. | පරණ සපත්තු දෙකක්. |
| 12. | කාන්තා කුඩයක්. |
| 13. | දෙමළ ක්‍රිස්තියානි පොත් දෙකක්. |
| 14. | චිත්‍ර රෙදි යාර තුනක්. |
| 15. | පටරෙදි යාර දෙළහක් පමණ (කෑලි නවයක්) |
| 16. | පරණ සරමක්, කමිසයක්, බැනියමක් හා තුවායක්. |
| 17. | රෙදි යාර දෙකක්. |
| 18. | කැප් නොමැති "පයිලට්" පෑන් දෙකක්. |
| 19. | කාන්තා කුඩයක්, අඩුවක් හා පරණ "පයිලට්" පෑනක්. |
| 20. | පාච්චි කළ හම් ඇඳුම් බෑගයක්. |
| 21. | පුවක් රාත්තල් 25½ ක් පමණ. |
| 22. | පොත් හතරක් :—කෘෂ්චොප් වාදය<br>ද තියරි ඔෆ් අර්ත්ස් ඔරිජින්.<br>මැක්සිම්කා<br>ලියෝ ටොල්ස්ටෝයි. |
| 23. | පොත් තුනක් :— ද ඩිංගෝ<br>ද ට්‍රෙටියාකර් ගැලරි.<br>ද සෝවියට් බාර් |
| 24. | පොත් තුනක් :— කිං සොලමන්ස් මයින්ස්.<br>ප්‍රාථමික පාසැල් උසස් ගණිතය<br>පරංගි හා හමුද. |
| 25. | පොත් තුනක් :— ලිවිං ස්ප්‍රිංස්.<br>කැප්ටන් කාශ්මීර්<br>බිෂෝ මයි වයිෆ්. |
| 26. | "පයිලට්" පෑනක්. |
| 27. | පට රෙදි යාර එකහමාරක්. |
| 28. | රැවුල කපන ආරක්ෂා සහිත දලි පිහි දෙකක්. |
| 29. | කුඩා ළමයින්ගේ පට ගවුම් හතරක්. |
| 30. | "මගේ නීතිඥයා" පොත. |

1–569—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

---

## රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත්

### මෙරට නිපදවන රට බිම වෙළඳාමට බලපත්‍ර ඉල්ලීමයි

වර්ෂ 1964 ක් වූ ජනවාරි මස 7 වෙනි දින මම, 1964 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වලංගු, යාකොට ඇති උප ලේඛනයේ සඳහන් බලපත්‍රය, කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් ඉල්වූ බව අංක 200 සහ 19.9.1930 දතම දරණ සුරාබදු නිවේදනයට අනුකූලව මෙයින් දනුම් දෙනු ලැබේ.

#### උප ලේඛනය

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : සාමාන්‍යාධිකාරී, ගල්ඔය සංවර්ධන මණ්ඩලය, 415, බුලර්ස් පාර, කොළඹ 7.
2. ඉල්ලුම් කරන ලද බලපත්‍රයේ විස්තර : පරිපාක ස්ප්‍රිතු සහ තත්ත්වය වෙනස් කල ස්ප්‍රිතු වෙළඳාම.
3. අලුත් බල පත්‍රයක් ද නැත්නම් පරණ බල පත්‍රයක් අලුත් කිරීමක් ද ? : අලුත් බල පත්‍රයක්.
4. බල පත්‍ර ඉල්ලන ස්ථානයේ විස්තර : 415, බුලර්ස් පාර, කොළඹ 7.

බී. කේ. අබයරත්න,
සාමාන්‍යාධිකාරී,
ගල්ඔය සංවර්ධන මණ්ඩලය.

1–452—64.1.17 දින අංක 13,924 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි